කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය
(I කොටස )

9 වන ශ්‍රේණිය

මිනිත්තු 30
30 minutes

නම/ විභාග අංකය ........................................................

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 2 කින් යුක්තය. I හා II කොටස් සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.
* මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40කි.

---

- අංක 1, 2, 3 ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර දී ඇති වචන අතරින් තෝරා ලියන්න.
  **(අවියෝජනීය, හරබර, වක්තෘවරයෙකි, හිටුගැවිල්ලේ, ඉක්මනට)**

(01) ශ්‍රීමත් ආතර් සී ක්ලාක් මහතා විද්‍යාත්මක අනාවැකි පළ කළ ........................................

(02) වන බැද්දෙන් එළියට බහින තැන තියෙන ලියදි ඔළින් කරල් කඩා ගන්නවා
..............................................

(03) ගීතයේ තේමාව සමඟ ............................................... ලෙස බැඳුණු තනු නිර්මාණයක් තිබීම එහි සාර්ථකත්වයට හේතුවක් විය.

- පහත සඳහන් ප්‍රකාශයට ගැළපෙන ප්‍රස්තාව පිරුළක් ලියන්න.

(04) "යමෙකුගෙන් ලාභ ප්‍රයෝජන ලබමින් හිට ඔහුට ම විපත් සිදු කිරීම."

..................................................................................................

(05) "ද" නිපාතයෙන් අවසන් වන ප්‍රස්තාව පිරුළක් ලියන්න.

..................................................................................................

- පහත ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති හිස්තැන මත යොදන්න.

(06) ශ, ෂ, ස යන අකුරු සිංහල වර්ණමාලාවේ ඌෂ්මාක්ෂරවලට අයත් වේ. (...........)

(07) 'ෂ' අක්ෂරය 'ක,ර' යන අකුරුවලට මුලින් යෙදේ. (...........)

(08) නිත්‍ය බහුවචන තුළින් ඒකාර්ථයක් ප්‍රකාශ වේ නම් එහි දී ආඛ්‍යාතය ඒකවචනයෙන් තැබිය යුතු ය. (...........)

(09) පහත සඳහන් උපමා හතර කියවන්න. එහි දී එක් උපමාවක් වැරදි ලෙස යොදා ඇත. එය තෝරා ඊට හිමි අංකය හිස් තැනෙහි ලියන්න.

(i) "හිම් කන්දක් වගේ සුදුම සුදු පාට"
(ii) "සඳ කිරණින් විකසිත වන පද්මයෝ මෙන්"
(iii) "යහපත් සමාජය හා ආගමික හැදියාව ගසට පොත්ත සේ" (...........)
(iv) "පාළු කතරක හොල්මනක් ලෙස සුදු බිත්ති පෙනේ." (...........)

- පහත ප්‍රශ්න දෙකෙහි අක්ෂර වින්‍යාසය වැරදි වචනයක් බැගින් ඇත. එය තෝරා යටින් ඉරි අඳින්න.

(10) ශාක, අෂ්ටාංග, විස්මය, සීඝ්‍රගාමී, පාෂාණ

(11) අලුත්ගම, උත්කෘෂ්ට, භාෂාව, කළුලැල්ල, දේශණය

(12) මුලින් යොදා ඇති වචනවලට ගැළපෙන සේ ඉදිරියේ ඇති අර්ථ යා කළ විට නිවැරදි පිළිතුර අදාළ හිස්තැන ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1) | විසර්ජනය | i) | නිතරම |
| 2) | සුදරකයන් | ii) | ඉදුණු |
| 3) | විළිකුන් | iii) | හොඳ දරුවන් |
| 4) | නිත්තෙන් | iv) | විසඳීම |

1) iii, i, ii, iv  2) iv, iii, i, ii  3) iii, iv, i, ii  4) iv, iii, ii, i

- මුලින් යෙදී ඇති වචනයට අසමාන තේරුම ඇති වචනය තෝරා හිස්තැන මත ලියන්න.

(13) සිනිඳු - මොළොක්, ගොරෝසු, මෘදු කොමළ (...........)

- මුලින් යෙදී ඇති වචනයට විරුද්ධ වචනය තෝරා හිස්තැන මත ලියන්න.

(14) විකසිත - පුබුදු, පිපි, මුකුලිත, හැකසිත (...........)

- මුලින් යෙදී ඇති ව්‍යාකරණ විධියට උදාහරණයක් නොවන පදයක් ඇති වචනය තෝරා ලියන්න.

(15) උපසර්ග - දුසිරිත්, පරදේශ, සුගුණ, පිණිස (...........)

(16) - රටඋළු ගෙදර කඩමාලු ඇඳගත් හුරුබුහුටි ළමයි ඉනිවැට උඩින් පනිති.
ඉහත ප්‍රකාශයේ එන යුගල පදයක් තෝරා ලියන්න. (..............................)

(17) "වෙලේ පැලේ ගීත ගයා" යන්න අසම්භාව්‍ය ක්‍රියා පදයකට හරවා නැවත ලියන්න.

..................................................................................................................................

- හිස් තැන්වලට ගැළපෙන ක්‍රියා පද ලියන්න.

(18) රජ මැදුරේ නිරතුරුව ප්‍රදීපයෝ ..............................................................................

(19) අයෙක් ජනකවි අපට කියා ..............................................................................

(20) 'සෝමාරියා' 'කුයිල' යන ප්‍රාදේශීය ව්‍යවහාර වල තේරුම ලියන්න. ..................................................

කොළඹ අධ්‍යාපන කලාපය
දෙවන වාර පරීක්ෂණය - 2012

සිංහල භාෂාව හා සාහිත්‍යය
(II කොටස )

9 වන ශ්‍රේණිය

පැය 1 මිනිත්තු 30
One hour and 30 minutes

නම/ විභාග අංකය ..........................................................

- පළමුවන හා දෙවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ඔබේ පංතියේ දී පැවැත් වූ කණ්ඩායම් ව්‍යාපෘතිය ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) (i) දේශාභිමානී ගීත එකතුව හෝ නූතන සාහිත්‍යවේදීන් පිළිබඳ තොරතුරු ගොනුව හෝ ප්‍රබන්ධ රචනා එකතුවෙන්, ඔබ අයත් වූ කණ්ඩායම් ව්‍යාපෘතිය සකස් කළ ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න.

(ii) මෙම ව්‍යාපෘතිය සකස් කිරීමේ දී ගුරුවරයා/ ගුරුවරිය, ඔබට ලබා දුන් උපදෙස් මොනවා ද?

(iii) ව්‍යාපෘතිය සකස් කිරීමේ ක්‍රියාකාරකම තුළ නිරත වීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු 2 ක් ලියන්න.

(iv) මෙම කණ්ඩායම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී වඩාත් ම සිත් ගත් අවස්ථා මොනවා ද?

(v) ඔබගේ කණ්ඩායම් ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරීමේ දී ලකුණු ලබා දුන් නිර්ණායක දෙකක් ලියන්න.

(ලකුණු - 16)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200 කට නො අඩු රචනයක් ලියන්න.

(i) මම හොඳ ක්‍රීඩකයෙක් වී රටට සේවය කරමි.

(ii) මධ්‍ය කඳුකරයේ සුන්දරත්වය.

(iii) මා කැමති ලේඛකයා.

(iv) රටේ සෑම බිම් අඟලක් ම වගා කරමු.

(ලකුණු - 11)

(03)
- පොළොන්නරුව මානෙල්ගම මහා විදුහල.
- 9 ශ්‍රේණියේ දරුවන්ගේ චිත්‍ර ප්‍රදර්ශනය.
- විදුහලේ ප්‍රධාන ශාලාවේ.
- දින 03 ක්, උදේ 9.30 සිට සවස 5.30 දක්වා.
- ආරම්භය 2012 ජූලි 20.
- ප්‍රධාන ආරාධිත අමුත්තා, චිත්‍ර, ශිල්පී, හෙළරුවන් දිසානායක.
- ආරාධනාව දෙමාපියන්ට.
- විදුහල්පති ධර්මරත්න මහතාගේ මූලිකත්වයෙන්.

ඉහත තොරතුරු පාදක කරගෙන ආරාධනා පත්‍රයක් පිළියෙල කරන්න. (ලකුණු - 11)

(04) "වන සර දැක තම සිත බිය සලසා
ගන ගැබ ලෙළ දෙන විදුලිය විලසා
වන ගැබ ඔබිනොබ පැන යන නො ලසා
තැන තැන මුව රළ දැක යව සතොසා"

(i) මෙහි මුවන් තම සිත බිය ඇති කර ගත්තේ ඇයි?

(ii) මෙම කවියේ ඇති උපමාව හා උපමේය වෙන් කරන්න.

(iii) "වැහි වලාකුළ," "ප්‍රමාද නොවී," යන අදහස දෙන වචන දෙක, කවියෙන් උපුටා ලියන්න.

(iv) කවියේ තේරුම ඔබේ වචනවලින් ලියන්න.

(ලකුණු - 11)

(05) පහත දී ඇති කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(1) "ඔබ රැකුණොත් ලෝ කුඹුව ද අපහට සීත ගඟුලි ලංකා"

(i) මෙම පාඨය එන ගීතයේ පද රචකයා කවුද?

(ii) ඉහත ගීත කොටසේ තේරුම ලියන්න. (ලකුණු - 03)

(2) "දරුවෙනි, එසේ නම් කැඳවන්නටත් පළමු සතුරා අප වෙත එන්නේ ය."

(i) මෙසේ කීවේ කවුද?

(ii) අප වෙත එන සතුරා කවරෙක් ද? (ලකුණු - 02)

(3) "ඒක පුරාණේ පටන් පැවත එන කුඹුරු කෙරුවාවේ සම්මතයක්"

(i) මෙහි කියවෙන සම්මතය කුමක් ද?

(ii) මෙම කොටස උපුටාගත් පාඩමේ නම ලියන්න. (ලකුණු - 03)

(4) (i) වී ගොවිතැන හා සම්බන්ධ සියලු දෙනාගේ දයකත්වය ලබා ගැනීමට ගොවියා යොදාගත් අනගි උපක්‍රමය කුමක් ද?

(ii) වී වගාවේ දී අත්තම් ක්‍රමය යන්න හඳුන්වන්න. (ලකුණු - 03)

(06) (i) සේනාරත්න විදුහල්පති තුමාගෙන් ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න.

(ii) ප්‍රවීණ පත්‍රකලාවේදීහු හඳුන්වනු W5 සහ H න්‍යාය දැක්වෙන සූත්‍රය ලියා දක්වන්න.

(iii) ආතර් සී ක්ලාක් මහතා අපේ රටේ අභිමානයට දයක වූයේ කෙසේ දැයි කරුණු 02 ක් ලියන්න.

(iv) විවාදයකට සහභාගිවන කථිකයෙකු තුළ පැවතිය යුතු ගුණාංග 02 ක් ලියන්න.

(v) පද්‍යයක් රස විඳීමේ දී "කාව්‍යාලංකාර" ලෙස හඳුන්වන කරුණු 2 ක් ලියන්න.

(ලකුණු - 11)

(07) (i) 'මව්සෙනෝ නාට්‍යය', පදනම් කරගෙන එළිසමය සහිත කවි 02ක් නිර්මාණය කරන්න.

(ii) පහත එන ගද්‍ය කොටස කීප වරක් කියවා එහි වැදගත් ම කරුණු ටික වචන 15 - 20 අතර ප්‍රමාණයකින් තනි ඡේදයක් ලෙස ලියා දක්වන්න.

(ලකුණු - 11)

දේශාභිමානී හැඟීම්වලින් ඔද වැඩුණු කවීන් තුළ පහළ වූ විවිධ සංකල්පනා ගී පද ලෙස ලියැවී ඇත. සංගීතඥයෝ ඒවා මිහිරි ගීත බවට පරිවර්තනය කළහ. ගායක ගායිකාවෝ දේශ භක්තිය පෙරටු කොට ගෙන එම ගීත ගැඹුරු වූ මධුර ස්වරයෙන් ගායනා කළහ. අපි එබඳු වූ දේශාභිමානී ගී අසා රස විඳිමු. එම රසයෙන් කුල්මත් වෙන බොහෝ දෙනා තුළ තම මාතෘ භූමියට, ජාතියට, ආගමට ගෞරවණීය බවක් ඇති වීම වැළැක් විය නොහැකි ය.